"හෝමාගම අහසේ අද්භූත වස්තුවක්" යන මැයෙන් ජූනි 07 මව්බිම පුවත්පතේ පළවූ පුවත් වාර්තාවක් ආරම්භ වන්නේ "පිටසක්වල ජීවීන්ට අයත් බවට සැක කළ හැකි අබිරහස් පියාඹන පීරිසියක් වැනි සුවිශේෂී යානයක් හෝමාගම ඉහළ අහසේ සැරිසරා තිබේ" යනුවෙන් සඳහන් කරමිනි. මේ සඳහා මූලාශ්‍ර ලෙසින් සඳහන් කෙරෙන්නේ එම හඳුනානොගත් ආකාශ සංසිද්ධිය දැකි වෛද්‍ය ශිෂ්‍යයින් පිරිසක් ලබාදුන් ප්‍රකාශයන් වේ. මෙහිදී පාඨකයින් ලෙසින් අපට නැගෙන ප්‍රශ්න මේවායි.
1) යම් අයෙකු අහසේ දකිනා යම් කිසි හඳුනාගත නොහැකි ආකාශ සංසිද්ධියක්, පිටසක්වල ජීවීන්ට අයත් බවට සැක කළ හැකි අබිරහස් පියාඹන පීරිසියක් වැනි සුවිශේෂී යානයක් යනුවෙන් හැඳින්වීමට ඉක්මන් විය හැකිද?
2) එවන් ප්‍රකාශයක් සිදුකිරීමට පෙරාතුව ඒ සම්බන්ධ ප්‍රාමාණික මූලාශ්‍රයන්ගෙන් විමසා තහවුරු කරගත යුතු නොවේද?
කෙසේ නමුත් මව්බිම පුවත්පතේම ජූනි 08 වන දින මේ සම්බන්ධයෙන්ම පළ වන වාර්තාවේ සිරස්තලයෙන් ප්‍රකාශ වන්නේ "හෝමාගම අහසේ පෙනුණේ ඇමරිකාවෙන් අහසට යැවූ චන්ද්‍රිකා කිහිපයක ආලෝක ධාරා" යනුවෙනි. එහිදී ඊට අදාළව පිළිගත හැකි මූලාශ්‍රයන් ඔවුන් සඳහන් කොට ඇති බවද සඳහන් කරමු.

#MediaEthicsSL #lka #SinhalaPress #News #Mawbima #SundayMawbima